**ලග්ගල - පල්ලේගම ප්‍රාදේශීය සභාව.**

**----------------------------------------------**

**මාතලේ දිස්ත්‍රික්කය.**

**------------------------**

1. මූල්‍ය ප්‍රකාශන

----------------

1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

------------------------------

2017 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2018 මැයි 29 දින විගණනයට ඉදිරිපත් කර තිබූ අතර එම මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2018 ජූලි 31 දින සභාපතිවරයාට යවා ඇත.

1.2 තත්ත්වාගණනය කළ මතය

-----------------------------

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශන වලින් 2017 දෙසැම්බර් 31 දිනට ලග්ගල-පල්ලේගම ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම වලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

------------------------------------------

1.3.1 ගිණුම්කරණ අඩුපාඩු

------------------------

පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

(අ) ස්ථාවර වත්කම්වල එකතුව හා ප්‍රාග්ධන යෙදුමට ආදායමෙන් දායකවීමේ ගිණුමේ ශේෂය අතර රු.4,093,098 ක වෙනසක් විය.

(ආ) සමාලෝචිත වර්ෂයේදී මිලට ගෙන තිබූ රු.62,545 ක් වටිනා ඉන්වෙන්ට්‍රි භාණ්ඩ ගිණුම්ගතකර නොතිබීමෙන් එම වටිනාකමින් වත්කම් අඩුවෙන් දක්වා තිබුණි.

(ඇ) 2014 වර්ෂයේ දී වැඩිපුර ගෙවා තිබුණු රු.23,771 ක සේවක වැටුප්, සමාලෝචිත වර්ෂයේ දී ආපසු අයකරගෙන ආදායම් ණයගැති ගිණුමට බැර කිරීම හේතුවෙන් ආදායම් ණයගැති ශේෂය අඩුවෙන් දක්වා තිබුණි.

(ඈ) සභාව සතු වූ යතුරුපැදි දෙකක් තක්සේරුකර ගිණුම්ගත කිරීමට කටයුතු කර නොතිබුණි.

(ඉ) සමාලෝචිත වර්ෂයේ හා ඊට පෙර වර්ෂවල ඉදිකර තිබූ රු.4,115,256 ක් වටිනා ගොඩනැගිලි ස්ථාවර වත්කම් වශයෙන් හඳුනාගෙන ගිණුම්ගත කර නොතිබුණි.

(ඊ) පිටවල සමනල ක්‍රීඩාංගනයේ යටිතල පහසුකම් නගාසිටුවීම වෙනුවෙන් 2016 වර්ෂයේ දී ගිවිසුම්ගත වී තිබුණු රු.800,000 ක වටිනාකමින් රු.724,540 ක් පළාත් පාලන දෙපාර්තමේන්තුවෙන් 2017 වර්ෂයේ දී ලැබී තිබිය දී ණයගැතියන් වශයෙන් රු.800,000 ක් දක්වා තිබීම හේතුවෙන් ණයගැතියන් රු.724,540 ක් වැඩියෙන් දක්වා තිබුණි.

(උ) සමාලෝචිත වර්ෂය අවසානයට සභාව සතුව තිබූ බැංකු ජංගම ගිණුම් දෙකකට අදාළ එකතු වටිනාකම වූ රු.115,070 ක් ගිණුම්වලින් අත්හැරී තිබුණි.

(ඌ) සමාලෝචිත වර්ෂය අවසානයට ගබඩාවේ තිබූ ලිපිද්‍රව්‍ය තොගය ගණනය කර මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් කිරීමට කටයුතු කර නොතිබුණි.

1.3.2 නොසැසඳුණු ගිණුම්

-----------------------------

පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

(අ) මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන එකතුව රු.40,784,417 ක් වූ ගිණුම් විෂයන් 09 කට අදාළ ශේෂයන් සහ ඒවාට අදාළ උපයෝගී ලේඛන හා වාර්තාවල දැක්වෙන ශේෂයන් අතර වෙනස්කම් පැවති අතර නිරීක්ෂණය වූ අසමානතාවල එකතුව රු.3,854,651 ක් විය.

(ආ) සමාලෝචිත වර්ෂයේ ආරම්භයේ දී ගිණුම්වල දැක්වෙන ආරම්භක ශේෂ 04 ක් හා එදිනට උපලේඛන අතර වෙනස්කම්වල වටිනාකම රු.262,825 ක් විය.

(ඇ) වෙනත් ආදායම් ලේඛනයේ සඳහන් ආදායම් ප්‍රභවයන් හා ගිණුම්ගත කර තිබුණු වටිනාකම් අතර රු.86,307ක වෙනසක් විය.

1.3.3 අවිනිශ්චිත ගිණුම

--------------------

අවිනිශ්චිත ගිණුමේ ආරම්භක ශේෂය රු.1,836,420 ක් වූ අතර එම ශේෂය අවසන් ශේෂය ලෙස ගෙන තිබුණි. ශේෂ පිරික්සුමේ සහ ශේෂ පත්‍රයේ අවිනිශ්චිත ගිණුමේ ශේෂය රු.1,719,801 ක් ලෙස ගිණුම්ගත කිරීමෙන් ලෙජර් ගිණුම හා ශේෂ පත්‍රය අතර රු.116,619 ක වෙනස්කමක් දක්නට ලැබුණි.

1.3.4 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

-------------------------------------

(අ) ලැබිය යුතු ගිණුම්

--------------------

(i) දීර්ඝ කාලයක් තිස්සේ මූල්‍ය ප්‍රකාශනවල නොවෙනස්ව ඉදිරියට ගෙනෙමින් පවතින එකතුව රු.160,724 ක් වූ ලැබිය යුතු ගිණුම් ශේෂ 03 ක වටිනාකම නිරවුල් කර ගැනීමට සමාලෝචිත වර්ෂයේදී ද කටයුතු කර නොතිබුණි.

(ii) සමාලෝචිත වර්ෂය අවසාන වන විට ට්‍රැක්ටර් කුලී වශයෙන් රු.181,426 ක් අයවිය යුතුව තිබුණි.

(ආ) ගෙවිය යුතු ගිණුම්

---------------------

සමාලෝචිත වර්ෂය අවසන් දිනට ගෙවිය යුතු ගිණුම් ශේෂ 04 ක එකතුව රු.2,088,919 ක් වූ අතර දීර්ඝ කාලයක් තිස්සේ නිරවුල් නොකර පවතින මෙම ශේෂ සමාලෝචිත වර්ෂයේදීත් නිරවුල් කිරීමට පියවර ගෙන නොතිබුණි.

1.3.5 විගණනය සඳහා අවශ්‍ය ලිඛිත සාක්ෂි නොමැතිවීම

---------------------------------------------------------

අවශ්‍ය තොරතුරු ඉදිරිපත් නොකිරීම නිසා එකතුව රු9,882,171 ක් වූ ගිණුම් විෂයන් 06 ක් විගණනයේ දී සතුටුදායක ලෙස සත්‍යාක්ෂණය කිරීමට නොහැකි විය

1.3.6 අනුකූල නොවීම්

-------------------

නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම්

---------------------------------------------------------------------------

නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව | අනුකූල නොවීම |
|---|---|
| (අ) 1987 අංක 15 දරන ප්‍රාදේශිය සභා පනතේ 24 වගන්තිය | සභාව විසින් ඉදිකර ඇති මාර්ග ගැසට් කිරීමට කටයුතු කර නොතිබුණි. |
| (ආ) 1988 ප්‍රාදේශීය සභා (මූල්‍ය හා පරිපාලන) රීති | |
| i. රීති අංක 196 හා 197 | එක් එක් මාසය අවසානයේ දී පාරිභෝජන ගබඩා ද්‍රව්‍ය ලේඛනය පරීක්ෂාකර බලා ලේකම්වරයා විසින් අත්සන් තබා නොතිබුණි. |
| ii. රීති අංක 202 | එක් එක් වර්ෂය අවසානයේ දී ඉන්වෙන්ට්‍රි පොත, පාරිභෝගික භාණ්ඩ ලේඛනය සහ තොග පොත් තුලනය කර ශේෂ නව වර්ෂය සඳහා ඉදිරියට ගෙන ආ යුතු වුවද ජල හා විදුලි උපකරණ ලේඛනවල ඇතැම් භාණ්ඩ/ උපකරණ ශේෂ කර ඉදිරියට ගෙන නොතිබුණි. |
| iii. රීති අංක 214 | සමාලෝචිත වර්ෂයට අදාළ භාණ්ඩ සමීක්ෂණ කටයුතු කර නොතිබුණි. |
| iv. රීති අංක 217 | සභාව සතු හා සභාව විසින් ප්‍රයෝජනයට ගන්නා සියලුම ඉඩම් හා ගොඩනැගිලි පිළිබඳව පි.එස් 46 ආකෘතිය ප්‍රකාරව ලේඛනයක් යාවත්කාලීනව පවත්වා නොතිබුණි. |
| (ඇ) ශ්‍රී ලංකා ප්‍රාජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි 371(2) | 2015 හා 2016 වර්ෂවලදී අවස්ථා 04 කදී නිලධාරීන් 06 දෙනෙකුට ලබාදී තිබුණු රු.137,696 ක අත්තිකාරම් සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් පියවීමට කටයුතු කර නොතිබුණි. |
| (ඈ) 2009 අප්‍රේල් 16 දිනැති අංක 09/2009 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය | සියලුම රාජ්‍ය ආයතන වල ඇඟිලි සළකුණු සටහන් කිරීමේ යන්ත්‍ර මගින් පැමිණීම හා පිටවීම සනාථ කිරීම සිදුකළ යුතු වුවත් එපරිදි කටයුතු කර නොතිබුණි. |

1.3.7 ප්‍රමාණවත් අධිකාර බලයකින් තහවුරු නොවූ ගනුදෙනු

1988 ප්‍රාදේශීය සභා (මූල්‍ය හා පරිපාලන) රීති 103, 106 පරිදි කවර හෝ සේවාවක් වෙනුවෙන් කෙරෙන ගෙවීමක් සඳහා වවුචරයක් සහතික කරනු ලබන කල්හි අදාළ පරිදි තහවුරු කිරීම් ලේඛන ඉදිරිපත් කළ යුතු වුවද ප්‍රාදේශීය සභාවේ ලේකම් විසින් විවිධ පුහුණු වැඩසටහන් සඳහා සහභාගී වීම වෙනුවෙන් පැමිණීමේ සහතික ඉදිරිපත් කිරීමෙන් තොරව ගමන් වියදම් හා සංයුක්ත දීමනා වශයෙන් රු.14,969 ක් ගෙවා තිබුණු බවත් එකී කාර්යයන් සඳහා සහභාගී වූයේද යන්න තහවුරු කර ගැනීමට සාක්ෂි නොතිබුණි.

## 2 මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵලය

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.74,906 ක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.2,409,840 ක් විය.

### 2.2 මූල්‍ය පාලනය

පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

(අ) 2016 වර්ෂයේ සිට ලග්ගල ප්‍රාදේශීය සංවර්ධන බැංකුවේ පවත්වාගෙන යනු ලබන රු.1,000,000 ක් බැගින් වූ ස්ථාවර තැන්පතු දෙකක් සඳහා අලුත්කිරීම් සහතික ලබාගැනීමට කටයුතු කර නොතිබුණි.

(ආ) සභාව සතු මහජන බැංකුවේ පවත්වාගෙන යනු ලබන ජංගම ගිණුම් දෙකක එකතුව රු.115,070 ක් ගිණුම්වලින් අත්හැරී තිබුණු අතර එම ගිණුම් 2012 වර්ෂයේ සිට අක්‍රීයව පැවතුණි.

### 2.3 ආදායම් පරිපාලනය

#### 2.3.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම්

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාළව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | | 2017 | | | | 2016 | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | ආදායම් ප්‍රභවය | ඇස්තමේන්තුගත ආදායම | බිල්කළ ආදායම | රැස් කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | ඇස්තමේන්තු ගත ආදායම | බිල්කළ ආදායම | රැස් කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
| | | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| (i) | වරිපනම්භාබදු | 220,520 | 90,000 | 25,300 | 132,320 | 500 | 2,611 | - | 69,360 |
| (ii) | කුලී | 47,600 | 99,100 | 79,300 | 36,200 | 115,600 | 106,100 | 69,960 | 36,140 |
| (iii) | බලපත්‍රගාස්තු | 837,000 | 342,100 | 342,100 | - | 715,500 | 502,265 | 502,065 | - |
| (iv) | වෙනත්ආදායම් | 3,512,000 | 2,276,084 | 1,476,084 | 800,000 | 2,785,000 | 3,013,962 | 2,211,522 | 802,440 |
| | එකතුව | 4,617,120 | 2,807,284 | 1,922,784 | 968,520 | 3,616,600 | 3,624,938 | 2,783,547 | 907,940 |

2.3.2 ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය

සභාව විසින් ආදායම් වර්ධනය කරගැනීමට කටයුතු නොකිරීම හේතුවෙන් 2016 වර්ෂයේ රු.6,450,849 ක් වූ වෙනත් ආදායම් සමාලෝචිත වර්ෂයේ දී රු.4,405,128 ක් දක්වා රු.2,045,721 කින් හෙවත් 46% කින් අඩුවී තිබුණි.

2.3.3 අක්කර බදු

වසර 05 කට පෙර සිට ඉදිරියට ගෙනමින් පවතින හිඟහිටි අක්කර බදු ශේෂය රු.65,435 ක් විය.

2.3.4 කුලී

සමාලෝචිත වර්ෂයේ අවසානයට හිඟ කඩ කුලී හා නිවාස කුලී වශයෙන් රු.126,510 ක් අයවිය යුතුව තිබුණි.

2.3.5 බලපත්‍ර ගාස්තු

සමාලෝචිත වර්ෂය සඳහා වෙළඳ බලපත්‍ර සම්බන්ධව සමීක්ෂණයක් සිදුකර නොතිබුණු බැවින් බිල්කළ ආදායම නිවැරදිව තහවුරු කරගැනීමට නොහැකි විය.

2.3.6 වෙනත් ආදායම්

පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

(අ) සමාලෝචිත වර්ෂය අවසානයට හිඟ ජල ගාස්තු ලෙස රු.446,132 ක් පවතින නමුත් අදාළ උපලේඛන සමඟ එහි වෙනස්කම් නිරීක්ෂණය වීමෙන් ජල පාරිභෝජන ලේඛනය අනුව බිල්කිරීම්වල නිවැරදිතාවය තහවුරු කරගත නොහැකි විය.

(ආ) ලැබිය යුතු ජල සම්බන්ධතා ගාස්තු ලෙස දක්වා තිබෙන රු.231,897 ක ශේෂයක් වර්ෂ කිහිපයක සිට අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

2.3.7 උසාවි දඩ හා මුද්දර ගාස්තු

-------------------------------

පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් සහ අනෙකුත් බලධාරීන්ගෙන් 2017 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතුව තිබූ උසාවි දඩ හා මුද්දර ගාස්තු රු.5,510,682 ක් විය.

3 මෙහෙයුම් සමාලෝචනය

-----------------------------

3.1 කාර්යසාධනය

-----------------

ප්‍රාදේශීය සභා පනතේ 3 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගිතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවයේ සුබ විහරණය, පහසුව හා සුභසාධනය යන සභාව විසින් ඉටු කළ යුතුව තිබුණු කර්තව්‍යයන් ඉටු කිරීම පිළිබඳව අනාවරණය වූ කරුණු පහත දැක්වේ.

(අ) අතුරු ව්‍යවස්ථා

------------------

ප්‍රාදේශීය සභා පනතේ 126 වගන්තිය යටතේ ප්‍රධාන කාරණා 17 ක් ඉටුකිරීම සඳහා අතුරු ව්‍යවස්ථා පනවා ගැනීමට කටයුතු කර තිබූ නමුත් 2017 දෙසැම්බර් 31 දින වන විටත් ඉතිරි අතුරු ව්‍යවස්ථා 15 ක් පනවා ගෙන නොතිබුණි.

(ආ) ක්‍රියාකාරී සැලැස්ම

----------------------

පනවා තිබූ අතුරු ව්‍යවස්ථා අනුව සභාව විසින් ඉටු කළ යුතුව තිබුණු කර්තව්‍යයන් වෙනුවෙන් වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මක් පිළියෙල කර නොතිබුණි.

(ආ) ඝන අපද්‍රව්‍ය කළමනාකරණය

----------------------------------

පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

i. සමාලෝචිත වර්ෂය තුළ ඝන අපද්‍රව්‍ය බැහැර කිරීම සහ කළමනාකරණය වෙනුවෙන් රු.1,007,677 ක වියදමක් දරා තිබුණ ද කසළ නිසි කළමනාකරණයකින් තොරව රජයේ ඉඩමකට දිනපතා බැහැර කරමින් පැවතුණි.

ii. දිනපතා එකතු වන කසළ තේරීම හෝ වෙන්කිරීම සිදුනොකර පොලිතීන් අපද්‍රව්‍ය වලදැමීම සිදුකර තිබුණි. දිරන කසළ භාවිතා කර කොම්පෝස්ට් නිපදවීම, නොදිරන කසළ ප්‍රතිචක්‍රීකරණය වැනි දීර්ඝ කාලීන කසළ කළමනාකරණ ව්‍යාපෘතියකට යොමුවීමට සභාව විසින් කටයුතු කර නොතිබුණි.

3.2 මානව සම්පත් කළමනාකරණය

-----------------------------------

පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය

(අ) සේවක පුරප්පාඩු හා අතිරික්ත

----------------------------------

සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින වන විට සභාවේ කාර්ය මණ්ඩල පුරප්පාඩු 22 ක් පැවති අතර මෙම පුරප්පාඩු 22 න් 13 ක්ම ද්විතික මට්ටමේ කාර්ය මණ්ඩලය විය.

(ආ) 2014 ඔක්තෝබර් 01 හා 2014 ඔක්තෝබර් 24 දින පත්වීම් ලැබූ කාර්ය මණ්ඩල සේවකයින් 11 දෙනෙකු වෙනුවෙන් කාර්යක්ෂමතා කඩඉම් විභාග නොපවත්වා වර්ෂ 03 කට අධික කාලයක් ගතවී තිබුණු අතර මේ හේතුවෙන් එම සේවකයන් ස්ථිර කිරීමට නොහැකි වී තිබුණි.

3.3 මෙහෙයුම් අකාර්යක්ෂමතා
------------------------------
ගොඩනැගිලි ඉදිකිරීම් මත ගාස්තු අයකිරීම
-----------------------------------------------
මොරගහකන්ද ව්‍යාපෘතියේ නැවත පදිංචි කිරීම් පවුල් 1600 ක් පමණ සිටින බව වාර්තා වී තිබුණු අතර මෙම නැවත පදිංචි කළ පවුල් සඳහා 2016 හා 2017 වර්ෂවලට නව ගොඩනැගිලි සැලසුම් අනුමත කිරීම වෙනුවෙන් ගාස්තු අයකිරීමට කටයුතු කර නොතිබීම හේතුවෙන් රු.7,600,000 ක දළ ආදායමක් සභාවට අහිමි වී තිබුණි.

3.4 වත්කම් කළමනාකරණය
-----------------------------
3.4.1 වත්කම් ලේඛනගත නොකිරීම
-----------------------------------
ප්‍රාදේශීය සභාව සතුව පවතින ඉඩම් ගොඩනැගිලි, වාහන හා යන්ත්‍රෝපකරණ ලේඛනගත කර නොතිබුණි.

3.4.2 වත්කම් වලින් ලැබිය යුතු ආදායම් ලබා නොගැනීම
---------------------------------------------------------
පුරනැගුම ව්‍යාපෘතිය යටතේ රු.26,888,432 ක ගිවිසුම්ගත වටිනාකමකට ඉදිකර තිබූ ලග්ගල - පල්ලේගම සතිපොළ ගොඩනැගිල්ල 2016 දෙසැම්බර් 15 වන දින සභාව වෙත විධිමත්ව භාරදී තිබුණු නමුත් 2017 දෙසැම්බර් 31 දින වන විටත් අදාළ ගොඩනැගිල්ල තක්සේරු කර ටෙන්ඩර් කිරීම මගින් වෙළඳාම් කටයුතු සඳහා භාවිතා කිරීමට කටයුතු කර නොතිබුණි.

3.4.3 පවරා නොගත් වත්කම්
---------------------------
පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

(අ) මහවැලි සංවර්ධන අධිකාරියෙන් ලබාදී ඇති ප්‍රාදේශීය සභා කාර්යාල ගොඩනැගිල්ල ප්‍රාදේශීය සභාව වෙත පවරා ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ආ) සභාව විසින් ප්‍රයෝජනයට ගනු ලබන සුසාන භූමි මහජන පුස්තකාල හා ප්‍රජා ශාලා ගොඩනැගිලි පිහිටි ඉඩම් 51 ක් සභාව වෙත පවරා ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ඇ) ප්‍රාදේශීය සභාව විසින් භාවිතා කරනු ලබන වාහන 04 ක් සභාව වෙත පවරාගෙන නොතිබුණි.

3.4.4 නිෂ්ක්‍රීය / ඌන උපයෝජිත වත්කම්
----------------------------------------
සභාව සතු මිණි කුබෝටා ට්‍රැක්ටරයක් වර්ෂ 03 ක කාලයක සිට නිෂ්ක්‍රීයව පැවැතුණි.

3.4.5 වාර්ෂික භාණ්ඩ / තොග සමීක්ෂණය
----------------------------------------
සමාලෝචිත වර්ෂයට අදාළ භාණ්ඩ සමීක්ෂණ කටයුතු සිදුකර නොතිබුණි.

3.4.6 වාහන උපයෝජනය

------------------------

පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

(අ) රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශ ලේකම්ගේ 2016 දෙසැම්බර් 29 දිනැති 30/2016 අංක දරන චක්‍රලේඛය ප්‍රකාරව ප්‍රාදේශීය සභාව සතු වාහන 09 ක 2015 වර්ෂයෙන් පසු ඉන්ධන දහනය පරීක්ෂා කිරීමට කටයුතු කර නොතිබුණි.

(ආ) සභාව සතු ටිපර් රථයක මයිලෝ මීටරය ක්‍රියාකාරී තත්වයේ නොතිබුණු අතර එය අලුත්වැඩියා කිරීමට කටයුතු කර නොතිබුණි.

3.6 ආර්ථික නොවූ ගනුදෙනු

----------------------------

වාහන 05 ක් සඳහා වාහන ආදායම් බලපත්‍ර නියමිත දිනවලදී ලබානොගැනීම හේතුවෙන් රු.3,231 ක දඩ මුදලක් ගෙවා තිබුණි.

3.7 ප්‍රසම්පාදනය

---------------

3.7.1 ප්‍රසම්පාදන සැලැස්ම

------------------------

2006 ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 4.2.1 ප්‍රකාරව ප්‍රාදේශීය සභාව විසින් ප්‍රසම්පාදන සැලැස්මක් පිළියෙල කර නොතිබුණු අතර සමාලෝචිත වර්ෂය තුළ රු.4,750,739 ක මිලදී ගැනීම් ප්‍රසම්පාදන සැලසුමකින් තොරව කරගෙන තිබුණි.

3.7.2 කොන්ත්‍රාත් පරිපාලනය

---------------------------

පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

පිටවල සමනල ක්‍රීඩාංගනයේ යටිතල පහසුකම් නගා සිටුවීම

-------------------------------------------------------------------

පළාත් පාලන ආයතනවල යටිතල පහසුකම් නගා සිටුවීමේ ප්‍රාග්ධන වැඩසටහන - 2016 යටතේ මැදඇල සමෘද්ධි සමිතියට රු.800,000 ක මුදලකට 2016 ඔක්තෝබර් 30 දින පවරා වැඩ නිමකර තිබුණි. මේ සම්බන්ධයෙන් පහත කරුණු නිරීක්ෂණය විය.

i. නිමි වැඩ වාර්තාවේ විෂය අංක 11 අනුව සෙරමික් සේදුම් බේසම් 02 ක් හා ඒ සඳහා අපජල නල මාර්ගය සවි කිරීම වෙනුවෙන් රු.13,544 ක් ගෙවීම් කර ඇතත් අදාළ කාර්යය ඉටුකර නොතිබුණි.

ii. වැඩ විෂය අංක 14 යටතේ සවිකර තිබූ දොරවල් නිසි පරිදි සවිකර නොතිබූ අතර දොර අගුළු නිසි ප්‍රමිතයෙන් යුක්ත නොවීය. අදාළ වැඩ විෂය වෙනුවෙන් රු.29,789 ක් ගෙවා තිබුණි.

iii. වැඩ විෂය අංක 20 යටතේ සවිකර තිබූ ගේට්ටුව කැඩී තිබුණු අතර ඒ වෙනුවෙන් රු.12,000 ක් ගෙවා තිබුණි.

iv. වැඩ විෂය අංක 21 යටතේ ඇති 06 වන අයිතමයේ දැක්වෙන ගස් හඳුනා ගැනීමට හැකි පරිදි සිටුවා නොතිබුණු අතර ඒ වෙනුවෙන් රු.24,000 ක් ගෙවා තිබුණි.

4 ගිණුම් කටයුතුභාවය හා යහපාලනය

---------------------------------------

4.1 අයවැය පාලනය

-------------------

සමාලෝචිත වර්ෂය තුළ ආදායම් හා වියදම් අතර ප්‍රතිපාදන මාරු කිරීමෙන් අනතුරුව ද අයවැයගත හා තථ්‍ය වියදම් අතර සැලකිය යුතු විචලනයන් නිරීක්ෂණය වූයෙන් අයවැය ලේඛනය ඵලදායී කළමනාකරණ පාලන කාරකයක් ලෙස යොදාගෙන නොතිබුණි. මේ සම්බන්ධයෙන් පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) ඇස්තමේන්තුගත ආදායම් හා තථ්‍ය ආදායම් අතර සියයට 10 සිට 400 දක්වා පරාසයක විචලනයක් පැවතුණි.

(ආ) වැය විෂයන් 25 ක් සඳහා ඇති කළ රු.508,050 ක ප්‍රතිපාදනවලින් කිසිදු වියදමක් දරා නොතිබුණි.

(ඇ) වැය විෂයන් 69 කට අදාළව ශුද්ධ ප්‍රතිපාදනය හා තථ්‍ය වියදම් අතර සියයට 10 සිට සියයට 100 දක්වා වූ පරාසයක විචලනයක් පැවතුණි.

4.2 අභ්‍යන්තර විගණනය

-------------------------

1988 ප්‍රාදේශීය සභා (මූල්‍ය හා පරිපාලන) රීති 5(7) ප්‍රකාරව අභ්‍යන්තර විගණන ඒකකයක් ස්ථාපිත කර ඇතත් අභ්‍යන්තර විගණන වාර්තා කිසිවක් නිකුත් කර නොතිබුණි.

4.3 විගණන හා කළමනාකරණ කමිටු

-------------------------------------

මධ්‍යම පළාත් ප්‍රධාන අමාත්‍යාංශ ලේකම්ගේ 2014 අගෝස්තු 01 දිනැති සීපීසී/සීඑම්එස්/10/06 අංක දරන චක්‍රලේඛය ප්‍රකාරව වාර්ෂිකව විගණන හා කළමනාකරණ කමිටු 04 ක් පැවැත්විය යුතු වුවත් 2016 වර්ෂය තුළ කමිටු වාර 01 ක් පමණක් පවත්වා තිබුණි.

4.4 නොවිසිඳී ඇති නිරීක්ෂණ හා පිළිතුරු නොදුන් විගණන විමසුම්

----------------------------------------------------------------------

නිකුත් කළ විගණන විමසුම් 02 ක් සඳහා පිළිතුරු ලබාදී නොතිබුණි.

5 පද්ධති හා පාලන

--------------------

විගණනයේ දී නිරීක්ෂණය වූ අඩුපාඩු වරින්වර සභාවේ අවධානයට යොමුකර ඇති අතර පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු කළ යුතුය.

| පද්ධතිය | අඩුපාඩුව |
|---|---|
| (අ) ගිණුම්කරණය | වාර්ෂික ගිණුම්වලට අවශ්‍ය ලේඛන පිළියෙල කර නොතිබීම. |
| (ආ) වත්කම් / දේපළ | i. සභාව සතු ඉඩම් හා ගොඩනැගිලි, රථ වාහන, යන්ත්‍රෝපකරණ, කාර්යාල උපකරණ හා ගෘහ භාණ්ඩ ලේඛනගත නොකිරීම. |

|  |  |  |  |
|---|---|---|---|
|  |  | ii. | ඉඩම් ගොඩනැගිලි සම්බන්ධයෙන් අයිතිය ආරක්ෂාව තහවුරු කර නොතිබීම. |
| (ඈ) | තොග | i. | ගබඩාවට ද්‍රව්‍ය ලැබීම, ගබඩාවෙන් ද්‍රව්‍ය නිකුත් කිරීම හා භාවිතයටගත නොහැකි ද්‍රව්‍ය ආපසු ගබඩාවට භාරගැනීම සම්බන්ධයෙන් විධිමත් තොග පාලනයක් ක්‍රියාත්මකව නොතිබීම. |
|  |  | ii. | තොග ලේඛන නිසි පරිදි යාවත්කාලීන කර නොතිබීම. |
| (ඇ) | ණයගැති / ණයහිමි | i. | ණයගැති හා ණයහිමි ශේෂ හඳුනාගත හැකි පරිදි උපලේඛන පිළියෙල කර නොතිබීම. |
|  |  | ii. | විවිධ ණයගැති, විවිධ ණයහිමි හා ආදායම් ණයගැති ගිණුම තුළ ඉදිරියට ගෙන එන ශේෂ සඳහා කාලවිශ්ලේෂණ පිළියෙල කර නොතිබීම. |
| (ඉ) | සේවක කළමනාකරණය |  | සමාලෝචිත වර්ෂයේ අවසන් දිනට කාර්ය මණ්ඩලයේ තනතුරු 22 ක පුරප්පාඩු සම්පූර්ණ කර නොතිබීම. |